සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 9 – First Term Test – April 2019
පළමු වාර පරීක්ෂණය - 2019 අප්‍රේල් - 9 ශ්‍රේණිය

කාලය : පැය 2
Time :2hour

## Civic – I
පුරවැසි අධ්‍යාපනය– I

Name :- .................................................... Grade : -................ Index number:-....................

❖ සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

- අංක 1-5 දක්වා ප්‍රශ්නවලට වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. ''කිසියම් භූගෝලීය ප්‍රදේශයක් තුළ වාසය කරන ජන කණ්ඩායම් තම විවිධ අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා සාමූහිකව කටයුතු කිරීම'' යන ප්‍රකාශය අදාළ වන්නේ,
   (1) පවුලට ය (2) සමාජයට ය
   (3) පුද්ගල(යන්)ට ය (4) පවුල් සමූහයකට ය

2. සමාජ සුරක්ෂිතතාව පිළිබඳ පහත ප්‍රකාශයන් අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
   (1) සමාජයෙන් ලැබෙන ආරක්ෂාව හා රැකවරණයයි
   (2) පුද්ගලයාට බියෙන් හා සැකයෙන් තොරව ජීවත් වීමට අවශ්‍ය පසුබිම සැකසීම ය
   (3) පුද්ගලයාට තම ජීවිතය යහපත් ලෙස පවත්වාගෙන යෑමට අවශ්‍ය පසුබිම සැකසීම ය
   (4) ඉහත ප්‍රකාශ සියල්ලම නිවැරදි ය

3. පහත ප්‍රකාශ හා සම්බන්ධ ගැලපෙන පිළිතුර තෝරන්න.

| | | | |
|---|---|---|---|
| I | නිදහස් පසෙහි නිදහස් ශ්‍රමය වැළැක්වීමට කටයුතු කිරීම | a | තෝමස් අල්වා එඩිසන් |
| ii | මව විසින් සියවසෙහි ශ්‍රේෂ්ඨයකු බවට පත් කරනු ලැබූවෙකි | b | ආගමික සමිති |
| iii | ආගමික සහජීවනය ඇති කිරීම සඳහා බෞද්ධ ගීත රචනා කරන ලද්දේ | c | මර්සලින් ජයකොඩි |
| iv | සමාජ සුරක්ෂිතතාවයට දායක වන ආයතනයකි | d | ඒබ්‍රහම් ලින්කන් |

   (1) bacd (2) abcd (3) dacb (4) cdab

4. අධ්‍යාපන ක්ෂේත්‍රයේ දියුණුවට තාක්ෂණය බලපා ඇති අවස්ථාවක් නොවන්නේ,
   (1) උඩිස් ප්‍රක්ෂේපණ යන්ත්‍රය (2) බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය
   (3) නැනෝ පරිමාණ රොබෝ යන්ත්‍ර (4) ඊ- ලර්නින්

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

5. පහත සඳහන් කාර්යයන්ගෙන් සමාජ සුරක්ෂිතතාව සඳහා ආරක්ෂක හමුදාවන්ගෙන් පොදුවේ කෙරෙන කාර්යයන් දෙක වන්නේ,

(a) මුහුදු මාර්ගයේ සිදුවන මත්ද්‍රව්‍ය හා නීති විරෝධි වෙළෙඳාම වැළැක්වීම

(b) අනවසර සංක්‍රමණ වැළැක්වීම

( c) හදිසි ආපදා හා විපත් අවස්ථාවලදී සහන සේවා සැලසීම

( b) කැරලි කෝලාහල හා ත්‍රස්තවාදී ක්‍රියා මර්දනය කිරීම

(1) a හා c (2) c හා d

(3) b හා c (4) c හ a

(ල.2 x 5 =10)

- **අංක 6 සිට 10 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර ලියන්න.**

| | |
|---|---|
| 6. ''සාධාරණ හා නීතිගරුක සමාජයක් ගොඩ නැගීම'' යන දැක්ම මූලික කරගත් ආයතනය වන්නේ, | |
| 7. ''පිතෘ භූමිය සඳහා'' යන ආදර්ශ පාඨය මූලික කරගත් ආයතනය වන්නේ, | |
| 8. ''ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරී'' යන ආදර්ශ පාඨය දක්නට ලැබෙන ආයතනය වන්නේ, | |
| 9. හදිසි අනතුරු, හදිසි කරදර සම්බන්ධයෙන් ක්ෂණිකව ක්‍රියාත්මක වන ඇමතුම් අංකයකි | |
| 10. රජයේ සියලුම නීතිමය කටයුතු සම්බන්ධයෙන් වගකීම දරනු ලබන්නේ | |

(ල.2 x 5 =10)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට අදාල ප්‍රකාශ නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුන ද යොදන්න.**

11. රටක මූලික නීතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ය. ( )
12. අපරාධ නීතිය, සිවිල් නිතිය හා වෙනත් අණ පනත් ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අයත් ය. ( )
13. සමථ මණ්ඩල සාමාජිකයන් ලෙස පත් කරනු ලබන පුද්ගලයන් ගමෙහි සාමාන්‍ය පුරවැසියන් ලෙස ජීවත් වන්නන් ය. ( )
14. ළමයින්ගේ ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කරන ළමා ආරක්ෂක අධිකාරිය සමාජ සුරක්ෂිතතාව සඳහා ද කටයුතු කරයි. ( )
15. වින්දිත දරුවන්ට මනෝ සමාජීය සේවාවන් සැපයීම ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යයක් නොවේ. ( )

(ල.2 x 5 =10)

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

- **අංක 16 සිට 20 දක්වා ප්‍රකාශ හා සම්බන්ධ ගැලපෙන පිළිතුර තෝරා අදාළ අක්ෂරය ඉදිරියෙන් යොදන්න.**

| | | | | |
|---|---|---|---|---|
| 16. | ජාන තාක්ෂණ ශිල්පීන් | ☐ | a | කෘෂිකාර්මික අංශය |
| 17. | ගෘහ අලංකරන ශිල්පීන් | ☐ | b | කාර්මික අංශය |
| 18. | දිරන නොදිරන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළ රැකියා | ☐ | c | බැංකු ක්ෂේත්‍රයේ නව තාක්ෂණික වෙනසකි |
| 19. | ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර | ☐ | d | නව ප්‍රවණතා ඔස්සේ විවෘත වන රැකියාවකි |
| 20 | ඩ්‍රෝන කැමරා ශිල්පීන් | ☐ | e | සේවා අංශයේ නව තාක්ෂණික වෙනසකි |

(ල.2 x 5 =10)

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 9 – First Term Test –April 2019

පළමු වාර පරීක්ෂණය - 2019 අප්‍රේල් - 9 ශ්‍රේණිය

## Civic– II

## පුරවැසි අධ්‍යාපනය– II

Name :- ................................................... Grade : -................ Index number:-....................

### II කොටස

❖ ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.

1. (i) ''සමාජයක්'' යනු කුමක් ද? (ල.03)
   (ii) සමාජයක මූලික ලක්ෂන 4ක් ලියන්න. (ල.04)
   (iii) සමාජ සුරක්ෂිතතාව සඳහා දායක වන ආයතන 2ක් නම් කර සමාජ සුරක්ෂිතතාව සඳහා එම ආයතය වලින් ඉටු කෙරෙන කාර්යයන් 2ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)

2. (i) ''සමාජ සුරක්ෂිතතාවය'' යනු කුමක් ද? (ල.03)
   (ii) මද්‍යසාර හා මත්ද්‍රව්‍ය භාවිතය, සමාජ විරෝධී ක්‍රියා, හා විෂමාචාර ක්‍රියා මැඩ පැවැත්වීම සඳහා ක්‍රියාත්මක වන ආයතන 4ක් ලියන්න. (ල.04)
   (iii) මද්‍යසාර හා මත්ද්‍රව්‍ය භාවිතය සමාජයට අහිතකර ලෙස බලපාන ආකාරය කරුණු 2ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල.05)

3. (i) සමාජ සුරක්ෂිතතාව සඳහා සකස් කර ඇති නීති විවිධ මූලාශ්‍ර පදනම් කරගෙන සකසා ඇත. එවැනි මූලාශ්‍ර 3ක් ලියන්න. (ල.03)
   (ii) අපරාධ නීතිය යටතේ දඬුවම් ලැබිය හැකි වැරදි 4ක් ලියන්න. (ල.04)
   (iii) ජාතික ළමා ආරක්ෂක අධිකාරියෙන් කෙරෙන කාර්ය 3ක් සඳහන් කර, සාමාන්‍ය ජනතාවට එයට සහාය විය හැකි ආකාර 2ක් ලියන්න. (ල.05)

4. (i) ''යෝග්‍ය තාක්ෂණය'' යනු කුමක් ද? (ල.03)
   (ii) තාක්ෂණික වෙනස්වීම් නිසා ඇතිවන හිතකර බලපෑම් 2ක් සහ අහිතකර බලපෑම් 2ක් ලියන්න. (ල.04)
   (iii) ''තිරසාර සංවර්ධනය '' යනු කුමක්දැයි සඳහන් කර ඒ සඳහා යෝග්‍ය තාක්ෂණය යොදා ගැනීමෙන් ලැබෙන ප්‍රතිලාභ 2ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)

5. මිනිසාගේ අසීමිත වුවමනාවන් ඉටුකර ගැනීමට අතීතයේ සිටම භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සිදු විය.

   (i) ඒ අනුව ඕනෑම රටක ආර්ථිකයේ දක්නට ලැබෙන ප්‍රධාන ක්‍රියාවලි 3 නම් කරන්න. (ල.03)

   (ii) තාක්ෂණයේ වෙනස්වීමත් සමඟ කෘෂිකාර්මික අංශයේ සහ සේවා අංශයේ සිදුවී ඇති වෙනස් කම් 2 බැගින් ලියන්න. (ල.04)

   (iii) තාක්ෂණයේ වෙනස්වීමත් සමඟ කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන ශ්‍රම විභජනය හා විශේෂීකරණය නිසා ලැබී ඇති යහපත් ප්‍රතිඵල 2ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)

6. වර්තමානය වන විට රැකියා වෙළෙඳපොළෙහි නව ප්‍රවණතාවන් රැසක්ම හඳුනාගත හැක.

   (i) රැකියා වෙළෙඳපොළෙහි නව ප්‍රවණතා වල බලපෑම මත බිහි වී ඇති රැකියා 3ක් ලියන්න. (ල.03)

   (ii) රැකියා වෙළඳපොලෙහි ඇති නව ප්‍රවණතාවයන්ට අනුව හැඩ ගැසීමේදී ඔබ විසින් සපුරා ගත යුතු සුදුසුකම් 2ක් ලියන්න. (ල.04)

   (iii) ආර්ථිකයේ සිදුවන විවිධ වෙනස්කම් පුද්ගලයා හා සමාජය කෙරෙහි ඇති කරන අහිතකර බලපෑම් 2ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)

7. මානව සමාජයේ පැවැත්ම සඳහා අවශ්‍ය ගුණාංගයකි, යහජීවනය

   (i) ''යහජීවනය'' යනු කුමක් ද? (ල.03)

   (ii) යහජීවන ගුනාංග 2ක් ලියන්න. (ල.04)

   (iii) ''යහජීවනය'' යන්න වර්තමාන සමාජයට අවශ්‍ය වීමට බලපා ඇති හේතු 2ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.05)